www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජනාධිපතිගේ අලුත් දේශපාලන කරනම නිසා වෘත්තීය සමිති එකමුතුව අර්බුදයට යයි

**ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි**
**2015 ජුලි 08**

එලැඹෙන මහ මැතිවරනයේ දී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂට එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් (එජනිස) නාමයෝජනා දීමට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සැරසෙන බවට පසුගිය දිනවල ආරංචි පැතිරයත් ම "සාධාරන සමාජයක් සඳහා වූ ව්‍යාපාරය" ට අනුබද්ධ වෘත්තීය සමිති එකමුතුවේ නිලධාරි කල්ලිය බෙහෙවින් කම්පාවටත් අර්බුදයටත් පත්ව සිටියි.

ඉකුත් ජනාධිපතිවරන සමයේ දී මෙම සංවිධානය පිහිටුවා ගත්තේ සිරිසේන ඔසවා තැබීම සඳහා දියත් කෙරුන ව්‍යාපාරයේ කොටසක් ලෙස ය. රජයේ හෙද නිලධාරීන්ගේ සංගමය, ලංකා ගුරු සංගමය ඇතුලු සමිති පනහක් මෙම සමිති එකමුතුවට ඇතුලත් වන අතර මධ්‍යම පන්තික කන්ඩායම් සහ පුද්ගලික බස් හිමියන්ගේ සංගමය ද ඊට සම්බන්ධව සිටියි.

රාජපක්ෂගේ "ඒකාධිපති පාලනය" පරාජය කර "යහපාලනයක්" ඇති කිරීමේ නමින් මෙම සංවිධානය සිරිසේන බලයට ගෙන ඒම සඳහා දර දිය ඇද්දේය. සමිති එකමුතුව පසුගිය සතියේ අලුත් උද්ඝෝෂනයක් සඳහා පෙරට ආවේ "ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය" ආරක්ෂා කර ගැනීම සඳහා රාජපක්ෂට නාම යෝජනා නො දෙන ලෙස ද ඔහු බලයට පත්වීම වලක්වන ලෙස ද සිරිසේනගෙන් ඉල්ලා සිටීම සඳහා ය.

කොලඹ, වෘත්තිකයන්ගේ ශ්‍රවනාගාරයේ ජුනි 30 වෙනිදා පැවති මාධ්‍ය හමුවක දී "මෛත්‍රීපාල සිරිසේන මහතා අප බලයට පත් කලේ සමාජ වෙනසක් සහ දේශපාලන වෙනසක් කිරීමේ අරමුනින්" බව පැවසූ සාධාරන සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරයේ කැඳවුම්කරු සමන් රත්නප්‍රිය, "කිසිදු ලෙසකින් නැවත මහින්ද රාජපක්ෂ බලයට පත් කිරීමේ වැඩ පිලිවෙලකට සහය නොදෙන්න" යැයි සිරිසේන ගෙන් ඉල්ලා සිටියේ ය.

රත්නප්‍රිය එහිදී සඳහන් කල ආකාරයට සිරිසේනට ලක්ෂ 62 ක ජනයා චන්දය දුන්නේ "ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය සඳහා කැප වූ" ආන්ඩුවක් බලයට ගෙන ඒමේ "ප්‍රාර්ථනාව" ඇතිවය. රත්නප්‍රිය ඇතුලු සමිති නිලධරය විසින් සිරිසේන ගේ සහ දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂයේ (එජාප) ආන්ඩුව බලයට ඒම පිටුපසින් පැවති සැබෑ දේශපාලනික සහ ජාත්‍යන්තර සාධක දැනුවත් ව ම වසන් කරනු ලබයි.

ඇත්ත ට ම සිදු වුයේ ජීවන වියදම ඉහල යාම සහ ප්‍රජාන්ත්‍රවාදී අයිතීන්ට එල්ල කල ප්‍රහාර නිසා රාජපක්ෂ ආන්ඩුව කෙරෙහි මහ ජනයා තුල පැසවමින් තිබූ වෛරය සිරිසේන සහ එජාප විසින් ගසා කෑමයි.

එමෙන් ම, සිරිසේන-වික්‍රමසිංහ හවුල බලයට දමා ගැනීමේ දී එක්සත් ජනපදයේ ඔබාමා පාලන තන්ත්‍රය ප්‍රමුඛ භූමිකාවක් ඉටු කලේ ය. ඒ චීනය මත වැඩි පුර වාරු වෙන ගමන් චීනය සහ ඇමරිකාව අතර තුලනය වීමට උත්සාහ කල රාජපක්ෂ තනත්‍රය වෙනුවට ආසියානු කලාපය තුල සිය මූලෝපායාත්මක අවශ්‍යතාවයන්, විශේෂයෙන් ම චීනය හුදකලා කිරීමේ සහ මිලිටරිමය ලෙස වැටලීමේ පිලිවෙත සමග ශ්‍රී ලංකාව ඍජුව පෙල ගස්වා ගැනීම සඳහා ය.

රාජපක්ෂ පාලනය කෙරෙහි පැවති මහජන විරෝධය සිරිසේන-වික්‍රමසිංහ හවුල වෙතට අවමං ගත කිරීමේ දී මෙම සමිති එකමුතුවත්, නව සම සමාජ පක්ෂය, එක්සත් සමාජවාදී පක්ෂය හා පෙරටුගාමී සමාජවාදී පක්ෂය ඇතුලු ව්‍යාජ වාම පක්ෂ සහ සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන ප්‍රධාන භූමිකාවක් ඉටු කලහ.

රාජපක්ෂ තන්ත්‍රය මෙන් ම සිරිසේන-වික්‍රමසිංහ හවුල මහා ව්‍යාපාරිකයන්ගේ සහ විදේශ ආයෝජකයන්ගේ උවමනාකම් රැකීමටත්, කම්කරු පන්තියේ ජීවන තත්වයන්ට සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ට පහර දීමේ සමාජ ප්‍රතිවිප්ලවීය වැඩ පිලිවෙල ක්‍රියාවට

දැමීමටත් කැප වූ පාලන තන්ත්‍රයකි. එමෙන් ම එය චීනය මත වැඩියෙන් වාරු වී සිටීමේ රාජපක්ෂගේ විදේශ පිලිවෙතෙන් වෙනස් ව ඇමරිකාව ප්‍රමුඛ අධිරාජ්‍යවාදී බලයන්ගේ තුන්වන ලෝක යුද සැලසුම් සමග ඍජුව ම පෙල ගැසුනු ආන්ඩුවකි.

දහ නවවෙනි ව්‍යවස්ථා සංශෝධනය, සිරිසේන ආන්ඩුව මගින් ක්‍රියාවට දමා ගැනීමට බලාපොරොත්තු වූ "දේශපාලන ප්‍රතිසංස්කරන" වල වැදගත් පියවරක් ලෙස රත්නප්‍රිය හුවා දක්වයි. සංශෝධනයෙන් සිදු කෙරුනේ ජනාධිපතිගේ බලතල ඉතා සුලු සීමා කිරීමකට යටත්කොට අගමැතිට යම් විධායක බලතල පැවරීමක් මිස මහජනතාවට එරෙහිව පාලක පන්තිය විසින් යොදා ගනු ලබන විධායක බලතල අහෝසි කිරීමක් හෝ ලිහිල් කිරීමක් නොවේ. එය නව රූපාකාරයකින් රාජ්‍යය ශක්තිමත් කර ගැනීමකි.

පොලිස්, මැතිවරන හා අධිකරන කොමිෂන් සභා ගෙන ඒමට පාර්ලිමේන්තුව තුල "වාතාවරනයක්" තිබුනේ නැතැයි රත්නප්‍රිය පවසයි. රාජපක්ෂට මෙන් ම සිරිසේනට හෝ වික්‍රමසිංහට එවැනි අවශ්‍යතාවක් නැත. දහනව වන සංශෝධනය හෝ රත්නප්‍රිය විසින් හුවා දක්වනු ලබන අනෙකුත් "දේශපාලන ප්‍රතිසංස්කරන" වලින් කම්කරු පන්තියේ සහ පීඩිත මහජනතාව ගේ කිසිදු ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් ආරක්ෂා නොවේ. ඊනියා ප්‍රතිසංස්කරනවල එල්ලය වන්නේ ධනපති දේශපාලන සංස්ථාපිතය, ධනපති අධිකරනය, පොලිසිය සහ ධනපති මැතිවරන ක්‍රමය කෙරෙහි මහ ජනයා අතර පුලුල් ව පැතිර පවතින අවිශ්වාසය තුනී කිරීම ය.

ලෝක ධනවාදයේ ගැඹුරු වන අර්බුදය තුල, ලෝකයේ කිසිදු රටක ධනපති පාලක පන්තීන්ට කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් කිසිවක් හෝ ආරක්ෂා කල නොහැක. ඊට විපරීත ව සිදුවන්නේ කම්කරු පන්තිය විසින් පසුගිය සියවස තුල සිය අරගල මගින් දිනා ගත් සියලු ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් මැඩලීමකි.

අතිශය ගැඹුරු ආර්ථික සහ දේශපාලන අර්බුදයක ගිලී සිටින සිරිසේන-වික්‍රමසිංහ ආන්ඩුව රාජපක්ෂ ආන්ඩුවටත් වඩා රුදුරු ලෙස වැඩකරන ජනතාවගේ ජීවන තත්වයන් ට සහ ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට පහර එල්ල කරනු ඇත.

මෙම සමිති එකතුව, ව්‍යාජ වම්මුන් හා මධ්‍යම පන්තික ඊනියා බුද්ධිමතුන් විසින් සිරිසේන-වික්‍රමසිංහ ආන්ඩුව වෙනුවෙන් ක්ෂමාලාපයන් ඉදිරිපත් කරමින් එය රැකීමට දරන උත්සාහය මගින් පෙන්නුම් කෙරෙන්නේ, අධිරාජ්‍යවාදී ලෝක යුද සැලසුම් සමග පෙල ගැසීමට සහ වැඩකරන ජනතාවට එරෙහිව සමාජ ප්‍රතිවිප්ලවයේ පිලිවෙත් ක්‍රියාවට දැමීමට කැසකවන එම තන්ත්‍රයට සහයෝගය දීමට ඔවුන්ගේ ඇති සූදානම යි. යුද්ධයේ සහ සමාජ ප්‍රතිවිප්ලවයේ පිලිවෙත් වලට එරෙහිව කම්කරු පන්තිය ස්වාධීන දේශපාලන බලවේගයක් ලෙස ඉස්මත්තට ඒම ගැන ඔවුන් පරම ලෙස ම විරුද්ධ ය.

රජයේ සේවකයන්ට රුපියල් 10,000 ක දීමනාවක් ගෙවීම ඇතුලු සොච්චම් සහන කිහිපයක් ලබා දුන් නමුත් ජීවන තත්වයන් වඩ වඩාත් පහල වැටීම නිසාත් ජනාධිපතිවරනයේ දී දුන් පොරොන්දු ඉටු කිරීමට අසමත් වීම නිසාත් සිරිසේන-වික්‍රමසිංහ ආන්ඩුව කෙරෙහි වර්ධනය වන මහජන අතෘප්තිය සහ වෛරය ගසා කැමත් එමගින් කම්කරු පන්තියට විරුද්ධ ව වර්ගවාදී බලවේග පෙරට ගැනීමත් එල්ල කර ගත් විසකුරු උද්ඝෝෂනයක් රාජපක්ෂ සහ කල්ලිය දියත් කර ඇත.

සිරිසේන-වික්‍රමසිංහ ආන්ඩුව රට "අස්ථාවර කිරීම, සංවර්ධන කටයුතු ඇනහිටවීම, කොටි ත්‍රස්තවාදය යලි හිස එසවීම හා කොටි ත්‍රස්තවාදය පරාජය කර දිනා ගත් නිදහස අහිමිවීම ආදී චෝදනා එල්ල කරමින් ආරම්භ කර ඇති උද්ඝෝෂනය හරහා යලි ආන්ඩු බලය අල්ලා ගැනීමට රාජපක්ෂ හා ඔහුගේ කල්ලිය බලාපොරොත්තු වෙති. රාජපක්ෂ සහ කල්ලියේ මෙම වර්ගවාදී ව්‍යාපාරය කම්කරු පන්තියට විරුද්ධව ෆැසිස්ට් බලවේග ඉස්මත්තට ගැනීමේ තැතක ද යෙදී සිටිති.

මහ මැතිවරනයෙන් කොයි හවුල බලයට ආවත් ක්‍රියාවට දැමෙනු ඇත්තේ අධිරාජ්‍ය ගැති හා කම්කරු පන්තියට විනාශය කටින යුද්ධයේ සහ සමාජ ප්‍රතිවිප්ලවයේ පිලිවෙත් ය. එහෙයින් සිරිසේන-වික්‍රමසිංහ හවුලත් රාජපක්ෂ හා කල්ලියත් අතර තෝරා ගැනීමක් කම්කරු පන්තියට නැත. කම්කරු පන්තිය ඉදිරියේ ඇත්තේ ලෝක ධනවාදය සහ ඒ සමග බැඳීගත් ශ්‍රී ලංකාවේ ධනපති පන්ති පාලනය පෙරලා දැමීමේ ඓතිහාසික වගකීමයි.

© www.wsws.org